# ටෙන්ඩර් දැන්වීමයි

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය රත්නපුර

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති ලෙස රත්නපුර දිස්ත්‍රික් ලේකම් විසින් රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු භාවිත කරන ලද පහත විස්තර සහිත වාහන විකිණීම සඳහා මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | වාහන අංකය | වාහන වර්ගය | වාහන මාදිලිය | නිෂ්පාදිත වර්ෂය | ටෙන්ඩර් ගාස්තු රු. | |
|---|---|---|---|---|---|---|
| | | | | | ආපසු ගෙවන මුදල (රු.) | ආපසු නොගෙවන මුදල (රු.) |
| 01 | 32-2235 | MITSUBISHI | පැජරෝ | 1985 | 22,500.00 | 1,000.00 |
| 02 | SG KB -0942 | MITSUBISHI | මොන්ටෙරෝ වී 76 | 2005 | 100,000.00 | 2,750.00 |

01. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට මෙම වාහන සහ ලංසු ලියවිලි 2026 අගෝස්තු මස 10 වන දින සිට 2026 අගෝස්තු මස 31 වන දින දක්වා වැඩකරන දිනවල පෙ.ව.09.00 සිට ප.ව. 03.00 දක්වා කාලය තුළ රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී නොමිලේ පරික්ෂා කළ හැකිය. මෙම කාලය තුළදී එක් එක් වාහනය සඳහා වෙන වෙනම ටෙන්ඩර් ලියවිලි ලබා ගත හැකි අතර, ඒ සඳහා දිස්ත්‍රික් ලේකම් රත්නපුර නමින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන ඉහත සඳහන් ලංසු ගාස්තුව සඳහා රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටි ලංකා බැංකු ශාඛාවෙන් දිස්ත්‍රික් ලේකම්, රත්නපුර යන නාමයට ගෙවා ලබා ගත් රිසිට් පත ඉදිරිපත් කිරීමෙන් ලංසු පත් ලබා ගත හැකිය.
02. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් සමඟ, එක් එක් වාහනය සඳහා ගෙවීම් කරන ලද ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ගාස්තුවට අදාළ ලදුපතෙහි මුල් පිටපත නියමිත වාහනයට අදාළ ටෙන්ඩර් ලියවිලි සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුය.
03. ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමේදී ලබා දෙනු ලබන කට්ටලයේ මුල් පිටපත හා දෙවන පිටපත සම්පූර්ණ කර එම පිටපත් දෙක වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා, එම පිටපත් දෙකම එක් කවරයක බහා මුද්‍රා තබා එහි වම්පස ඉහළ කෙලවරහි "භාවිතා කරන ලද වාහන මිලදී ගැනීම සඳහා ටෙන්ඩරය - වාහන අංකය ..............." යනුවෙන් සඳහන් කොට **සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නව නගරය, රත්නපුර** යන ලිපිනයට 2026 සැප්තැම්බර් මස 01 වන වන දින පෙරවරු 10.00 ට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලිය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලබයි. එදින පෙරවරු 10.15 ට ලංසුපත් විවෘත කිරීම සිදුකරන අතර ලංසුකරුට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට මෙම අවස්ථාව සඳහා සහභාගී විය හැකිය.